// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1899/40 – 2015 ජනවාරි 30 වැනි සිකුරාදා – 2015.01.30

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී.– 80/34.

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

පඩිපාලක සභා ආඥාපනතේ (136 පරිච්ඡේදයේ) 20(2)ඩී යන වගන්තිය යටතේ, ඇමතිවරයා විසින් වර්ෂ 1944 නොවැම්බර් මස 03 වැනි දින අංක 9,327, වර්ෂ 1949 අප්‍රේල් මස 01 වැනි දින අංක 9,963, වර්ෂ 1953 ජූනි මස 25 වැනි දින අංක 10,541, වර්ෂ 1958 ඔක්තෝබර් මස 27 වැනි දින අංක 11,568, වර්ෂ 1962 ජූනි මස 22 වැනි දින අංක 13,179 යන ගැසට් පත්‍රයන්හි පළ කරන ලද නිවේදන මාර්ගයෙන් නියම බලධාරියා ලෙස පත් කරනු ලැබූ ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල් තැන්පත්, දොන් චන්ද්‍රසිරි අබේරත්න ගුණවර්ධන වන මම, මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් එක් එක් ව්‍යාපාරයෙහි නියුක්ත සේවකයන් කෙරෙහි වර්ෂ 2015 ජනවාරි මාසය තුළ අදාළ කළ හැකි ජීවන වියදම් දර්ශකාංකය (2006/07 පදනම් වූ) 183.2 වන බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

**ඩී. සී. ඒ. ගුණවර්ධන,**
ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්.

2015 ජනවාරි මස 30 වැනි දින,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 563,
කොළඹ.

උපලේඛනය

1. කොකෝවා, කරදමුංගු සහ ගම්මිරිස් වැවීමේ සහ සැදීමේ ව්‍යාපාරය.

03 – 254/1

1A – G 21055 – 17 (2015/01)

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොකෝවා, කරදමුංගු හා ගම්මිරිස් වැවීම හා සෑදීම යන කර්මාන්තවල නියුතු සේවකයන්ට ගෙවිය යුතු විශේෂ දීමනා**

ඉහත සඳහන් කර්මාන්තය සඳහා 2015 ජනවාරි මාසයේ ජීවන වියදම් අංකය 183.2 වන නිසා 2015 පෙබරවාරි මාසයේ සාමාන්‍ය වැඩකරන දිනයක් වෙනුවෙන් ගෙවිය යුතු විශේෂ දීමනා පහත දැක්වෙන ආකාරයට බැව් පඩිපාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරය) 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

**කොකෝවා, කරදමුංගු සහ ගම්මිරිස් වැවීම හා සෑදීමේ කර්මාන්තය**

| *සේවා පන්තිය* | *සාමාන්‍ය වැඩකරන දිනයකට ලැබිය යුතු විශේෂ දීමනා* |
|---|---|
| | *රු. ශ.* |
| *දෛනික වැටුප් ලබන්නෝ –* | |
| කම්කරුවෙකුට - (පිරිමි/ගැහැණු) | 569 43 |

**හේරත් යාපා,**
කම්කරු කොමසාරිස්.

2015 ජනවාරි මස 30 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

03 – 254/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.